# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
# பொலிஸ் ஊடகப் பிரிவு
# POLICE MEDIA DIVISION

සුහුරුපාය , බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No — 10120

ෆැක්ස් / தொலைநகல / Fax — 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone — 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site — www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail — dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO — 1280/2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No — / 2024

දිනය / திகதி / Date — 06/08/2024 පැය 1110

## මාධ්‍ය නිවේදනය

**පොලිස් විශේෂ කාර්ය බලකාය විසින් සිදු කරන ලද වැටලීම් සම්බන්ධ තොරතුරු**

**01. 2024.08.05 වන දින පොලිස් විශේෂ කාර්ය බලකා නිලධාරීන් විසින් සිදු කරන ලද නීති විරෝධී මත්පැන් වැටලීම් සම්බන්ධ වාර්තාව පහත පරිදි වේ.**

| වැටලීම් ගණන | අත්අඩංගුවට ගත් සැකකරුවන් ගණන | නීති විරෝධී මත්පැන් ප්‍රමාණය (ලීටර්) | ගෝඩා ප්‍රමාණය (ලීටර්) | වෙනත් දේපල |
|---|---|---|---|---|
| 03 | 03 | 39 | 335 | තඹ දඟර 01<br>බැරල් 02 |

වැටලීම් සිදු කර අත්අඩංගුවට ගන්නා ලද සැකකරුවන් හා දේපල අදාළ පොලිස් ස්ථානයන් වෙත ඉදිරිපත් කර ඇත.

**02. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකය.**

2024.08.05 වන දින දහවල් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා විශේෂ මෙහෙයුම් ඒකකයේ නිලධාරීන් විසින් පැලියගොඩ පොලිස් වසමේ වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 07මිලි ග්‍රෑම් 100 ක්** හා **මත්ද්‍රව්‍ය ජාවාරමෙන් උපයාගන්නා ලද බවට සැකකරන මුදල් රුපියල් 86,000/= ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පැලියගොඩ පොලිස් ස්ථානය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 33 ක් වන පැලියගොඩ ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පැලියගොඩ පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**03. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.08.05 වන දින අළුයම් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් විසින් සපුගස්කන්ද පොලිස් වසමේ හෙයියන්තුඩුව ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 200 ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 34 ක් වන මල්වාන ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**04. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.08.04 වන දින රාත්‍රී කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් විසින් සපුගස්කන්ද පොලිස් වසමේ සියඹලාපේ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 44 මිලිග්‍රෑම් 400 ක්, ජීව පතරොම් 105 ක්, ජංගම දුරකථන 01ක් හා මත්ද්‍රව්‍ය අලෙවියෙන් උපයාගත් බවට සැක කරන මුදල් රුපියල් 100,000/= ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 36 ක් වන හෙයියන්තුඩුව ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**05. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.08.04 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් විසින් සපුගස්කන්ද පොලිස් වසමේ සියඹලාපේ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 05 මිලිග්‍රෑම් 300 ක් හා ජංගම දුරකථන 01ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 26 ක් වන හොඩියාදෙණිය ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**06. අයිස් මත්ද්‍රව්‍ය සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුර.**

2024.08.04 වන දින සවස් කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා ගෝනහේන කඳවුරේ නිලධාරීන් විසින් සපුගස්කන්ද පොලිස් වසමේදී වැටලීමක් සිදු කර සැකකටයුතු කැබ් රථයක් පරීක්ෂා කර **අයිස් මත්ද්‍රව්‍ය ග්‍රෑම් 15 මිලිග්‍රෑම් 500 ක්, විද්‍යුත් තරාදි 01, මුදල් ගණන් කරන යන්ත්‍ර 01ක්, සීලර් යන්ත්‍ර 01 ක්, ජංගම දුරකථන 01ක් හා මත්ද්‍රව්‍ය අලෙවියෙන් උපයාගත් බවට සැක කරන රුපියල් ලක්ෂ 10 කට අධික මුදලක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 40 ක් වන මොරගොල්ලාගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** පොලිස් මත්ද්‍රව්‍ය කාර්යංශය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**07. හෙරොයින් සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට - පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුර.**

2024.08.04 වන දින උදෑසන කාලයේ පොලිස් විශේෂ කාර්ය බලකා කුරුණෑගල කඳවුරේ නිලධාරීන් විසින් නාරම්මල පොලිස් වසමේ මැදගොඩ ප්‍රදේශයේ දී වැටලීමක් සිදු කර **හෙරොයින් ග්‍රෑම් 06 මිලිග්‍රෑම් 250 ක් හා ජංගම දුරකථන 01ක්** සමඟ සැකකරුවෙකු අත්අඩංගුවට ගෙන නාරම්මල පොලිසිය වෙත ඉදිරිපත් කර ඇත.

**අත්අඩංගුවට ගත් සැකකරු වයස අවුරුදු 31 ක් වන වැවගම ප්‍රදේශයේ පදිංචිකරුවෙකු වේ.** නාරම්මල පොලිසිය වැඩිදුර විමර්ශන පවත්වාගෙන යනු ලබයි.

**පොලිස් මාධ්‍ය කොට්ඨාසය.**